ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 11 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 දෙසැම්බර් 23 දින නගරාධිපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 ඔක්තෝබර් 01 දින සිට 2020 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාලයට අදාලව ගෙවිය යුතු ජෙනරේටර් අළුත්වැඩියා කිරීමේ ගාස්තුව රු.485,892 ක් ප්‍රවර්ථන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (ආ) ප්‍රවර්ථන වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.3,798,243ක වායුසමීකරණ යන්ත්‍ර ප්‍රාග්ධනිතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (ඇ) කාර්මික උපකරණ මිලදී ගැනීම සඳහා දරන ලද රු.249,430 ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | සභාවේ ස්ථාවර වත්කම් සම්බන්ධ ගිණුම් ප්‍රතිපත්තිය වන්නේ රු.5,000 ට වඩා වැඩි අයිතමයක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමයි. ඒ අනුව ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වටිනාකම් රු.249,430 ක් වේ. |

| | | |
|---|---|---|
| (ඇ) කාර්මික උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.116,760 ක් දෙවරක් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (ඉ) ජනජයසිටි වෙළඳ සංකීර්ණයේ 2018 වර්ෂයට අදාල කඩකුලී ආදායම් රු.2,380,956 ක් ප්‍රවර්ථන වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (ඊ) ප්‍රවර්ථන වර්ෂය අවසාන දිනට අයවිය යුතු මුළු කසළ බදු රු.4,179,285 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.756,750ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (උ) 2019 වර්ෂයට අදාල කසළ බදු බිල් කිරීම් රු.14,974,200 ක් වුවත් ආදායම් වියදම් ගිණුමට රු.11,908,915 ක් ලෙස බැරකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (ඌ) ජලනල ඇතිරීම සඳහා 2018 වර්ෂයේදී ජල සම්පාදන මණ්ඩලය විසින් පළුදු කරන ලද මාර්ග 02ක් නැවත පිළිසකර කිරීම වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.1,513,170 ක් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (එ) ජනජය සිටි සුපිරි වෙළඳ සංකීර්ණයේ ජෙනරේටරය සේවා කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.527,733 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදහස් දක්වා නැත |

**1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 ක එකතු වටිනාකම හා ඊට අදාල උපලේඛණවල එකතු වටිනාකම අතර රු.16,144,281ක වෙනසක් විය. | ගිණුම් ශේෂ සසදා නිවැරදි කළ යුතුවීම. | අදහස් දක්වා නැත |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| (i) සිනමා ශාලා 02 කින් ලැබිය යුතුව තිබූ විනෝද බදු රු.2,781,680 ක් වසර 04 ක සිට අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (ii) බාහිර පාර්ශවයක් වෙත නිකුත්කර තිබූ ග්‍රන්ථ 30ක් වෙනුවෙන් අයවිය යුතු රු.51,000 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| 2018 වර්ෂයේ අවසන් කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.188,581 ක් ගෙවා නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත |

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.586,637,185 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවීම. | අදහස් දක්වා නැත |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) මහා නගර සභා ආඥා පනත | | | |
| 247 ඇ(1) වගන්තිය | බලප්‍රදේශයේ ආදායම් කොට්ඨාශ 10ක පිහිටි සංවර්ධනය නොකළ හිස් ඉඩම් සංඛ්‍යාව 1218 ක් වුවද බදු අයකර තිබු හිස් ඉඩම් සංඛ්‍යාව 13ක් විය. | සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු අයකර ගත යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ආ) 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | වරිපනම් බදු අයකිරීම සඳහා සියළු නිශ්චල දේපළ වසර 05කට වරක් තක්සේරු කර නොතිබුණි. | බදු තක්සේරුව යාවත්කාලීන කර ගත යුතුය. | අදහස් දක්වා නැත |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | |
|---|---|---|---|
| (i) මු.රෙ 371(5) | සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන්ට දෙන ලද රු.477,227ක්වූ අත්තිකාරම් 12ක් නිරවුල්කර නොතිබුණි. | දෙන ලද අත්තිකාරම් අප්‍රමාදව පියවා ගත යුතුය. | අදහස් දක්වා නැත |
| (ii) මු.රෙ 1642<br>මු.රෙ 128 (1) (එ) | නුගේගොඩ බස් නැවතුම්පල සංකීර්ණයේ ජල කණුවල මනු සවිකර නිසි කළමනාකරණයක් නොකිරීම හේතුවෙන් රු.966,259ක ජල ගාස්තුවක් ගෙවීමට සිදුව තිබුණි. | පොදු ජල කණු නිසි කළමනාකරණයට යටත් කළ යුතුවීම. | අදහස් දක්වා නැත |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ<br>(i) XXIV පරිච්ඡේදයේ 4:2:5 වගන්තිය | විශ්‍රාම ගිය සේවකයන් 18 දෙනෙකුගෙන් අයවීමට ඇති හිඟ සේවක ණය රු.1,219,423ක් අදාල නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිකයෙන් අයකර නොගෙන ඔවුන්ට "නොඉල්ලුම් සහතිකපත්" නිකුත්කර තිබීම නිසා එම හිඟ ශේෂ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟහිටි ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ඇ) වෙනත් චක්‍රලේඛ | | | |
| (i) 1985 මාර්තු 20 දිනැති නාගරික සංවර්ධන අධිකාරි චක්‍රලේඛ අංක දෙසැ. 01<br>5 ඡේදය | අධික බිම් පරිමාණ අනුපාතය, අනවසර ඉදිකිරීම්, අනවසරයෙන් පරිහරණය වෙනස් කිරීම ආදිය සඳහා අයදුම්කරුවන්ගෙන් අයකරනු ලබන ගාස්තුවලින් සියයට 25ක් සහ මෝටර් වාහන නතර කිරීම සඳහා සපයා ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අයකරනු ලබන සේවා ගාස්තු නාගරික සංවර්ධන අධිකාරියට යවා නොතිබුණි. | ගෙවිය යුතු මුදල් නිරවුල් කරගත යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ii) 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන චක්‍රලේඛය | කඩකුලී තක්සේරුව වසර 03 කට වරක්වත් සිදුකළ යුතු වුවද අවසාන වරට සභාවේ කඩකුලී තක්සේරුව සිදුකර තිබුණේ 2013 වසරේදීය. | නොපමාව කඩකුලී තක්සේරුව කරගත යුතුය. | අදහස් දක්වා නැත |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන ආදායම ඉක්ම වූ වියදම රු.75,615,584 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.333,399,607 ක් විය.

## 2.2. මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වර්ෂ 06 සිට 25 අතර කාල පරිච්ඡේදය තුළ අගරු වී තිබුණු වටිනාකම රු.116,514ක් වූ චෙක්පත් 36ක් නිරවුල් කරගෙන නොතිබුණි. | අගරු චෙක්පත් සියල්ල නොපමාව නිරවුල් කරගත යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ආ) 1986 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නාගරික සංවර්ධන අධිකාරි තැන්පතු ලෙස එකතුකර තිබුණු රු.14,300,405 ක මුදලින්, රු.1,577,618ක වියදම් ප්‍රභවයන් ගිණුම්වලින් අනාවරණය කර නොතිබුණි. | සභාවේ සියළු ලැබීම් හා ගෙවීම් සම්බන්ධ තොරතුරු ගිණුම්වල ඇතුළත් කළ යුතුවීම. | අදහස් දක්වා නැත |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 239,525,000 | 246,594,368 | 225,995,509 | 100,551,431 | 222,000,000 | 237,433,234 | 211,577,509 | 101,507,737 |
| (ii) කුලී | 64,332,000 | 54,329,729 | 39,913,489 | 17,193,174 | 65,053,000 | 29,562,074 | 29,302,712 | 5,522,091 |
| (iii) බලපත්‍ර ගාස්තු | 11,601,000 | 6,430,110 | 6,445,110 | - | 6,361,000 | 6,715,639 | 6,715,639 | - |
| (iv) වෙනත් | 479,637,000 | 153,025,946 | 145,523,609 | 3,987,517 | 379,542,000 | 468,558,207 | 466,230,979 | 3,425,777 |
| එකතුව | 795,095,000 | 460,380,153 | 417,877,717 | 121,732,122 | 672,956,000 | 742,269,154 | 713,826,839 | 110,455,605 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.50,000 ඉක්ම වූ වරිපනම් එකක 167කින් රු.22,487,530 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් මුදල් නොපමාව අයකර ගත යුතුය. | අදහස් දක්වා නැත |

### 2.3.3 කුලී ආදායම

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සුපිරි වෙළඳ සංකීර්ණ, පොදු වෙළඳ සංකීර්ණ, ජනතා පොළ හා වැසිකිළිවලින් ප්‍රවර්ථන වර්ෂය අවසාන දිනට පැවති හිඟ කුලිය රු.16,841,017 ක් විය. | හිඟ කුලී නොපමාව අයකර ගත යුතුය. | අදහස් දක්වා නැත |
| (ආ) නුගේගොඩ ජනතා පොළ හා බස් නැවතුම්පලෙහි පිහිටි වැසිකිලිවලින් ප්‍රවර්ථන වර්ෂය ආරම්භක දිනට අයවිය යුතු රු.104,456 න් කිසිදු මුදලක් අයකරගෙන නොතිබු අතර නුගේගොඩ බස් නැවතුම්පල වැසිකිලියෙහි 2019 වසරට අදාල රු.214,500 ක් වූ කුලීවලින් වර්ෂය තුළ අයකර තිබුණේ රු.93,300 ක් පමණි. | හිඟ කුලී නොපමාව අයකර ගත යුතුය. | අදහස් දක්වා නැත |
| (ඇ) (i) ජනපය සිටි වෙළඳ සංකීර්ණයේ ව්‍යාපාරික ස්ථාන, කාර්යාල හා සිනමා ශාලාව ඇතුළු කඩ කාමර 421 කින්, ප්‍රවර්ථන වර්ෂයට අදාල කුලී ආදායම රු.25,181,120 ක් වූ අතර වර්ෂය තුළ අයකර ගැනීම් රු.14,860,760ක් විය. | හිඟ කුලී නොපමාව අයකර ගත යුතුය. | අදහස් දක්වා නැත |
| (ii) ඉහත වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවලින් 2019 වර්ෂය තුල කිසිදු කුලී වටිනාකමක් අයනොවූ කඩ කාමර 52 කට අදාළ මුදල රු.5,463,441 ක් විය. | හිඟ කුලී නොපමාව අයකර ගත යුතුය. | අදහස් දක්වා නැත |

## 2.4 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 226(1) වගන්තිය ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන්වල පැනවූ අධිභාර 10 කට අදාළව රු.24,386,888 ක් අයකර ගැනීමට තිබුණි. | පනවන ලද අධිභාර නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. | අදහස් දක්වා නැත |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අත්හැර දැමූ කර්තව්‍යන්<br>---------------------------<br>සභාව විසින් රු.295,579,801ක් වැය කර ආරම්භ කර තිබූ පිටකෝට්ටේ ජයරජ සිටි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, මහා නගර සභා වැඩ ඒකකය, වාහන නඩත්තු ඒකකය, ගබඩා සංකීර්ණ ගොඩනැගිල්ල, සහ නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි. | අදාළ කර්මාන්ත අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවේ සේවකයෙකුට රාජකාරි කාලය තුළ දෙල්කඳ ප්ලාසා වෙළඳ සංකීර්ණ භූමිය තුළ ජංගම වෙළඳ රථයක ආපන ශාලාවක් පවත්වාගෙන යාම සඳහා කළමනාකාරිත්වයේ සහාය ලැබී තිබුණි. | සේවකයන් රාජකාරියෙන් බැහැර කටයුතුවල නොයෙදවීමට කළමනාකාරීත්වය වගබලා ගත යුතුය. | අදහස් දක්වා නැත |

| | | |
|---|---|---|
| (ආ) 2015 වර්ෂයේ දී රු.48,320,909ක් වැය කර ඉදිකර තිබුණු අංගම්පිටිය දෙමහල් නිවාස සංකීර්ණය කොන්ත්‍රාත්කරුගේ නොසැලකිල්ල හේතුවෙන් 2016 වර්ෂය වනවිට බිත්ති හා ස්ලැබ් තට්ටුව පුපුරා යාම නිසා නේවාසිකයන් එම ගොඩනැගිල්ලෙන් ඉවත් කර තාවකාලික වාසස්ථාන ලබා දී තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වනවිට උක්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.49,337,170 ක් වැයකර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගෙන සිදුවී ඇති අලාභය අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නැත |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු<br>---------------------<br>2019 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරුවල පුරප්පාඩු 102 ක් පැවතුණු අතර සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අත්‍යාවශ්‍යම තනතුරු හොබවනු ලබන මාණ්ඩලික නිලධාරී තනතුරු 19න් 09 ක්ම පුරප්පාඩු වී තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ආ) සේවක ණය<br>---------------<br>2019 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය තුළ අයකර ගත නොහැකි රු.5,324,996ක ණය ශේෂයක් ද ඇතුළත් වී තිබුණු අතර ඊට අමතරව රු.1,786,633ක හඳුනාගත නොහැකි ණය ශේෂයක්ද පැවතුණි. | කාලය ඉක්මවූ හිඟ සේවක ණය ශේෂයන් අප්‍රමාදව අයකර ගත යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ඇ) රු.1,786,633 ක් වූ හඳුනා නොගත් සේවක ණය මුදල් වසර 10ට වැඩි කාලයක සිට අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) නාගරික සංවර්ධන අධිකාරී ගිණුමේ තැන්පත්කර තිබූ රු.11,500,000ක් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව ප්‍රවර්ථන වර්ෂයේදී ආපසු ලබා ගෙන සභාවේ මෙහෙයුම් කටයුතු සඳහා වැය කර තිබුණි. | වෙනත් පාර්ශවයන්ට අයත් මුදල් වැයකිරීමට අදාළ අනුමැතිය ලබා ගත යුතුය. | අදහස් දක්වා නැත |
| (ආ) ජනජය සිටි වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ හෝටලය හා පිහිණුම් තටාකය පවත්වාගෙන යාම වෙනුවෙන් බදු කරුවෙකු විසින් රු.97,119,572 ක් ගෙවා තිබුණද, සභාව විසින් ගිවිසගත් පරිදි සම්පූර්ණ කරන ලද පරිශ්‍රය බදු ගැණුම්කරු වෙත භාර දී නොතිබීම නිසා ප්‍රවර්ථන වර්ෂයේ අවසාන දිනවන විටත් එහි ව්‍යාපාර කටයුතු ආරම්භකර නොතිබුණි. | එකඟ වී ඇති ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. | අදහස් දක්වා නැත |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අරුණෝදය මාවතේ පිහිටි ඉඩමක වසර 15කට පෙර ඉදිකර ඇති, ප්‍රජාශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණයකින් තොරව විනාශ වෙමින් පැවතුණි. | දේපළ ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ආ)2015 වර්ෂයේ දී රු.2,825,375ක් වැයකර මුද්‍රණය කරන ලද අසිරිමත් කෝට්ටේ නැමති ග්‍රන්ථයේ පිටපත් 4,000 කින් 2019 වර්ෂය අවසාන දිනවන විට පිටපත් 2809 ක් හා රු.42,075ක් වටිනා එම පොත් ආවරණ කවර 561 ක් ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි. | අදාළ ග්‍රන්ථ බෙදා දීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත |

| | | |
|---|---|---|
| (ඈ) පොදු පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේදී අතුල රජමහා විහාරස්ථානයට අයත් ඉඩම් කොටසක් රු.1,680,000 කට බදු ගෙන තිබුණු අතර ඉඩමේ පස් පරීක්ෂණ වාර්තාව අනුව පසෙහි පවතින අධික දුර්වලතාවය හේතුකොට ගෙන ගොඩනැගිල්ල ඉදිකිරීමේදී විශාල අමතර පිරිවැයක් දැරීමට සිදුවන බව දන්වා තිබුණි. මෙම ඉඩම බදු ගෙන වසර 04 කට වැඩි කාලයක් ඉක්ම ගොස් ඇතත් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි. | සභා දේපළ ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත |

### 3.5.2 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධාවනයේ නොයොදවන රු.8,400,000ක් වටිනා ගිලන් රථය හා කසළ ලොරිය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අක්‍රිය වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත |

### 3.5.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ආදායම් එකතු කිරීමේ නිලධාරියෙකු 2018 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී එකතු කරන ලද කසළ බදු රු.103,150 ක් සභාවට ගෙවා නොතිබුණි. | සභාවට අයවිය යුතු මුදල නොපමාව අයකර ගත යුතුය. | අදහස් දක්වා නැත |
| (ආ) වාහන සඳහා 2019 වර්ෂයට ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී සිදුවී ඇති ප්‍රමාදය මත රු.61,020 ක දඩ මුදලක් ගෙවා තිබුණි. | වගකිය යුත්තන්ගෙන් අයකළ යුතුවේ. | අදහස් දක්වා නැත |
| (ඇ) සභාවට අයත්ව තිබූ රු.7,000,000 ක් වටිනා කැබ් රථය, 2017 අගෝස්තු 15 දින බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්වරයාගේ නිල රථය ලෙස පරිහරණය කිරීමට භාරදී තිබියදී ගිනිගෙන විනාශ වී තිබුණි. රථයේ වර්තමාන වෙළඳපල | අලාභය අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. | අදහස් දක්වා නැත |

වටිනාකම හා සභාවට වැය වූ අතිරේක වියදම් රු.7,046,180 ක් වූ අතර ලැබුණු රක්ෂණ වන්දි මුදලට අමතරව සභාවට සිදුවූ පාඩුව රු.1,546,180ක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. | අදහස් දක්වා නැත |

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේදී ඉදිකිරීම් ඇරඹූ ජනජය සිටි ගොඩනැගිල්ල වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණු රු.1,801,168,022 ක් තුළ ඇතුළත් වූ රු.113,181,798 ක අසම්භාවයන් හා අමතර වැඩ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ඡේදය විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රජයේ මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නැත |
| (ආ) නානායක්කාර මාවතේ නගර සභා වැඩ ඒකකය, වාහන නඩත්තු ඒකකය සහ ගබඩා සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම් 2014 වර්ෂයේදී ආරම්භ කර රු.17,651,987ක් වැයකර අත්තිවාරම් මට්ටම දක්වා නිමකර තිබියදී කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් අතහැර දමා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.11,743,270 ක බැංකු ඇපකර 02ක් කල් පිරීමට ප්‍රථම මුදල් කර ගැනීමට පියවර ගෙන නොතිබීම නිසා වැඩිපුර ගෙවා තිබුණු රු.6,183,416ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. ඉදිකරන ලද අත්තිවාරම් කොටසද වර්තමානය වනවිට පස් පුරවා වසා දමා කර්මාන්තය අත්හැර දමා තිබීම නිසා වැය කරන ලද රු.17,651,987 ක මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | සභා දේපළ ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුවීම හා වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 පිළිතුරු නොදුන් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාලව හා ඉකුත් වර්ෂයට අදාලව නාගරික කොමසාරිස්වරයා වෙත යොමුකළ ගණනය කළ හැකි එකතු වටිනාකම රු.145,847,368 ක් වූ විගණන විමසුම් 05 ක් සඳහා මෙතෙක් පිළිතුරු සපයා නොතිබුණි. | විගණන පනතේ 38 (1) (ඉ) පරිදි කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත |